බව චිත්‍රපටිය නැරඹීමේදී මා හට සිතුණේ ඇගේ දෙබස් උච්චාරණ විලාසයෙනි. ලකී ඩයස් හා චන්න පෙරේරා තම උපරිම දායකත්වය චිත්‍රපටියට ලබා දුන්නද අනෙක් නළු නිළියන්ගේ දුර්වලතා මැදින් ඔවුන් දෙදෙනාට චිත්‍රපටිය පුරාම එය අවසානය කරා රැගෙන යාමට විශාල මෙහෙවරක් කිරීමට සිදුවී ඇතිබව පෙනේ. සෙනසුරු මාරුව අයාසයකින් තොරව, කුතුහලයෙන් යුතුව බලා සිටිය හැකි සෙනසුරු ලබා සිටින අද සිංහල සිනමාවට ගැලපෙන චිත්‍රපටියකි. එහි තිස්ස අබේසේකරයන්ගේ දෙබස් ද ප්‍රබලය. ප්‍රේක්ෂකයාගේ දෙනෙතට ත්‍රාසය, කුතුහලය රඳවමින් පැය එකහමාරක් පුරා ඔවුන්ව බැඳ ගැනීමට සමත් වී සිටී. උදයකාන්ත එම ප්‍රතිභාවට කවදත් දක්ෂයෙකි.

හඳගම, ප්‍රසන්න යන සිනමාත්මක චලන රූප ගමන් මඟ සමඟ අපට උදයකාන්තගේ සිනමාව සැසඳිය නොහැක. ඔහුගේ රූප චලන භාවිතය වෙනම මඟකි. සෙනසුරු ලබා ඇති සිංහල සිනමාවට හැමදාම ඉතිහාසයේ කතාවස්තු සමඟ හරඹ කරමින් ප්‍රේක්ෂකයාව සිනමා ශාලාවට ගෙන්විය නොහැක. යුද්ධයද පෙන්වමින් හැමදාම ප්‍රේක්ෂකයා රැවටිය නොහැක. සිංහල සිනමාවට සෙනසුරු මාරුව වැනි චිත්‍රපටි අවශ්‍යයි සිතෙන්නේ හැත්තෑව දශකයේ තිරය මතක්වන විටය. හැත්තෑව දශකයේ මෙන් සතුටෙන් අවසන්වන වාණිජමය සිනමාවක් අදත් ප්‍රේක්ෂකයාට අවශ්‍ය කර තිබේ. එගැන සිතෙන විට සිංහල සිනමාවට උදයකාන්ත වැනි තරුණ අධ්‍යක්ෂවරුන්ගෙන් වැඩගත හැකි කාලයකි මේ. එහෙත් සෙනසුරු මාරුව අපේ සිනමාවට ලබා ඇති සෙනසුරු මාරු කිරීමට හැකි තරම් ප්‍රහලද යන්න තවමත් කිව නොහැක. ඒ එය තවමත් ප්‍රදර්ශනය කර නොමැති චිත්‍රපටියක් නිසාය. එසේම එහි කතාවේ සමහර දුර්වලතාවලට වගකිවයුත්තේ, තිස්ස ද උදයකාන්තද යන්න කිව නොහැක්කේ තිස්ස අබේසේකරයන් හා උදයකාන්ත යන දෙදෙනාම ප්‍රවීන සිනමා ශිල්පීන් වන නිසාය. සෙල්ටෙල් පෝන්වලින් පටන්ගන්නා සෙනසුරු මාරුව ලිපියකින් අවසන්වීමද දුකකි. එසේම තිස්ස අබේසේකරයන්ගේ අවසාන තිර කතාව තුලින් මීට වඩා සිනමාවට කලඑළියක් කරන්නට තිබුණානම් කෙතරම් අගේදැයි සේම, මහගම සේකරයන් අතින් ලියවුණු ගීයක් භාතිය සංතුෂ් වැනි පෙරලිකාරයන් අතට පත් වී අමුතුම කරණමක් ගසන්නාක් සේ තිස්සගේ සක්වා ලිහිණි උදයකාන්ත අතින් වෙනස් වී ඇත්දැයි සෙනසුරු මාරුව නැරඹීමේදී මට සිතුණි.





